සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**85 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

| | |
|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව | I, II |
| மனைப் பொருளியல் | I, II |
| Home Economics | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## ගෘහ ආර්ථික විද්‍යාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සම්පූර්ණ ප්‍රෝටීනයකි,
(1) කේසින්. (2) ලෙගියුමින්. (3) ග්ලූටන්. (4) ජෙලටින්.

**2.** සිරුර තුළ ගබඩා **නො වන** පෝෂකයකි,
(1) කාබොහයිඩ්‍රේට්. (2) මේද. (3) ප්‍රෝටීන්. (4) යකඩ.

**3.** මහා පෝෂකවලින් සිරුර තුළ සිදු වන කෘත්‍ය කිහිපයක් පහත දැක්වේ.
*A* – ශරීර වර්ධනය සිදු කරයි.
*B* – ශරීර අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ආරක්ෂා කරයි.
*C* – ශරීරයේ ප්‍රතිශක්තිය වර්ධනය කරයි.
*D* – ශරීර උෂ්ණත්වය පාලනය කරයි.
මේවායින් මේදවලින් ඉටු වන කෘත්‍ය වනුයේ
(1) *A* හා *B* ය. (2) *A* හා *C* ය. (3) *B* හා *D* ය. (4) *C* හා *D* ය.

**4.** උදේ ආහාර වේලක කාබොහයිඩ්‍රේට් ග්‍රෑම් 100 ක් ද ප්‍රෝටීන් ග්‍රෑම් 40 ක් ද මේද ද අඩංගු විය. මෙම ආහාර වේලෙන් ලැබුණු මුළු ශක්ති ප්‍රමාණය කිලෝ කැලරි 650 ක් නම්, එහි අඩංගු වූ මේද ප්‍රමාණය,
(1) ග්‍රෑම් 5 කි. (2) ග්‍රෑම් 10 කි. (3) ග්‍රෑම් 15 කි. (4) ග්‍රෑම් 20 කි.

**5.** සමේ නිරෝගීතාව සහ එහි මනා පැවැත්ම සඳහා උපකාරී වන පෝෂකයකි,
(1) විටමින් A. (2) විටමින් D. (3) කැල්සියම්. (4) අයඩින්.

**6.** කැල්සියම්, පොස්පරස් හා විටමින් D ඌනතාව පිළිබිඹු කරන රෝග ලක්ෂණයක් වන්නේ,
(1) සුදුමැලි බව ය. (2) හිසකෙස් වැටීම ය. (3) ඉදිමාව ය. (4) කකුල් බකල වීම ය.

**7.** සිරුර තුළ නිපදවා ගත හැකි විටමින් වර්ග දෙකකි,
(1) විටමින් A සහ $B_1$. (2) විටමින් E සහ $B_3$. (3) විටමින් D සහ K. (4) විටමින් C සහ $B_2$.

**8.** ෆෝලික් අම්ලයෙහි ඌනතාව නිසා ඇති වන රෝගයක් වන්නේ,
(1) ගලගණ්ඩයයි. (2) නිරක්තයයි. (3) තමස් අන්ධතාවයි. (4) ශීතාද රෝගයයි.

**9.** ආහාර පිරමීඩයේ, පහළ ම කොටසෙහි ඇති ආහාර කාණ්ඩවල බහුල ව අඩංගු පෝෂක වනුයේ,
(1) කාබොහයිඩ්‍රේට්, ප්‍රෝටීන් සහ විටමින් $B_1$ ය. (2) කාබොහයිඩ්‍රේට්, ප්‍රෝටීන් සහ විටමින් C ය.
(3) කාබොහයිඩ්‍රේට්, යකඩ සහ විටමින් $B_2$ ය. (4) කාබොහයිඩ්‍රේට්, මේද සහ විටමින් $B_3$ ය.

[දෙවැනි පිටුව බලන්න.

10. අයඩින් අඩංගු ආහාර ප්‍රභවයකි,
(1) අර්තාපල්. (2) මාළු. (3) රටකජු. (4) චීස්.

11. ගුණාත්මක බවින් මෙන් ම ප්‍රමාණාත්මක බවින් ද ඉහළ ප්‍රෝටීන් අඩංගු ආහාර ප්‍රභවයකි,
(1) කිරි. (2) සෝයා. (3) බිත්තර. (4) මස්.

12. නිරක්තය ඇතිවීමට හේතුවක් වන්නේ,
(1) ආහාර අඩුවෙන් ගැනීම ය. (2) අධිබර බව ය.
(3) ආන්ත්‍රික පරපෝෂිතයින් සිටීම ය. (4) අධික ලෙස කය වෙහෙසා වැඩ කිරීම ය.

13. 'X' යනු ප්‍රධාන පෝෂක තුනට අමතර ව යකඩ හා විටමින් C සපයන ආහාර වේලකි. 'X' විය හැක්කේ මින් කවරක් ද?
(1) බත්, අල කරිය, කංකුං බැදුම, සැමන් ව්‍යංජනය, ගෝවා මැල්ලුම
(2) බත්, දෙල් ව්‍යංජනය, මාළු කරිය, බෝංචි තෙම්පරාදුව, ගොටුකොළ සම්බෝලය
(3) බත්, කොස් ව්‍යංජනය, බණ්ඩක්කා තෙම්පරාදුව, කරවල බැදුම, කතුරු මුරුංගා මැල්ලුම
(4) බත්, වට්ටක්කා ව්‍යංජනය, සෝයා තෙම්පරාදුව, මාළු මිරිස් ව්‍යංජනය, පිපිඤ්ඤා සලාදය

14. ආහාර පරිරක්ෂණය සඳහා ඉවහල් වන කරුණු කිහිපයක් පහත දැක්වේ.
- pH අගය අඩුවීම
- බාහිරාස්‍රැතිය සිදුවීම
- තාපයට ලක් කිරීම
- සාන්ද්‍රණය වැඩිවීම

පරිරක්ෂණයේ දී ඉහත සඳහන් කරුණු සියල්ල ම ඉවහල් වූ ආහාරය මින් කුමක් ද?
(1) කරවල (2) අල ටොෆි (3) දිවුල් ජෑම් (4) මාළු ඇඹුල් තියල්

15. පාන් කේක් සකස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් තාපය සංක්‍රාමණය වනුයේ,
(1) සන්නයනය මගිනි. (2) සංවහනය මගිනි.
(3) විකිරණය මගිනි. (4) සන්නයනය සහ විකිරණය මගිනි.

16. පිටිමෝලියක් ඇසුරෙන් සකස් **නො වන** ආහාරය මින් කුමක් ද?
(1) චපාති (2) පිට්ටු (3) ඉඳි ආප්ප (4) රොටි

17. පලතුරු සලාදයක් සකස් කිරීමේ දී,
(1) ඇපල් සහ කෙසෙල් වැනි පලතුරු අවසානයේ දී එක් කළ යුතු ය.
(2) ඇලුමිනියම් හෝ වීදුරු බඳුනක් භාවිත කළ හැකි ය.
(3) සීනි එක්කර හොඳින් මිශ්‍ර කළ යුතු ය.
(4) ඕනෑම පලතුරක් භාවිත කළ හැකි ය.

18. පූර්ව ප්‍රසව සංවර්ධනයට අදාළ ඩිම්බ අවධිය අවසන් වනුයේ,
(1) ඩිම්බ කෝෂය තුළ දී ය. (2) ෆැලෝපීය නාළය තුළ දී ය.
(3) ගර්භාෂ ග්‍රීවය තුළ දී ය. (4) ගර්භාෂය තුළ දී ය.

19. භ්‍රෑණයාගේ ස්නායු පටක වර්ධනය සඳහා වැදගත් වන පෝෂකයකි,
(1) අයඩින්. (2) කැල්සියම්. (3) විටමින් C. (4) ෆෝලික් අම්ලය.

20. මාතෘ සායනයක දී පරීක්ෂණ මගින් හඳුනාගන්නා රෝග තත්ත්වයකි,
(1) මලබද්ධය. (2) පාචනය. (3) අධිරුධිර පීඩනය. (4) වකුගඩු ආබාධ.

21. MMR එන්නත මගින් වළක්වන රෝගයක් වනුයේ,
(1) කක්කල් කැස්ස ය. (2) කම්මුල්ගාය ය. (3) ගලපටලය ය. (4) පිටගැස්ම ය.

22. ජීවන චක්‍රය තුළ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන අවධි දෙකකි,
(1) මුල් ළමාවිය හා නව යොවුන්විය. (2) ළදරුවිය හා පසු ළමාවිය.
(3) මුල් ළමාවිය හා පසු ළමාවිය. (4) ළදරුවිය හා නව යොවුන්විය.



EXAMMOOD

23. ක්‍රීඩා භාණ්ඩ කිහිපයක ලක්ෂණ පහත දැක්වේ.
   A – සැහැල්ලු ය. විශාල ය.
   B – කොටස් ගලවා සවිකළ හැකි ය.
   C – සුළං පුරවා ඇත.
   D – විවිධ වර්ණවලින් යුක්ත ය.
   මින් ළදරුවන් සඳහා උචිත ක්‍රීඩා භාණ්ඩවල ලක්ෂණ වනුයේ,
   (1) A හා B ය. (2) B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

24. දරුවකු පෙර වයස් මට්ටමක දී පෙන්නුම් කළ හැසිරීම් රටා නැවත පෙන්නුම් කිරීම හඳුන්වන්නේ,
   (1) කෝපාවේගය ලෙස ය. (2) අනුකරණය ලෙස ය.
   (3) ප්‍රතිශේධනය ලෙස ය. (4) අනුවර්තනය ලෙස ය.

25. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක දරුවන්ගේ ඇස-අත සමායෝජනය වර්ධනය සඳහා වඩාත් සුදුසු ක්‍රියාකාරකම් දෙකක් වනුයේ,
   (1) ඔන්චිලි පැදීම සහ කිසියම් හැඩයක් තුළ පාට කොළ කැබලි ඇලවීම ය.
   (2) මල් තේරීම සහ කොළ අහුලා ගැනීම ය.
   (3) ඇඟිලිවලින් පින්තාරු කිරීම සහ පින්තූර ඇලවීම ය.
   (4) රූපයක් පාට කිරීම සහ බෝතලයකට වතුර පිරවීම ය.

26. අවුරුදු තුනක දරුවකු කෝපාවේගය පිළිබිඹු කිරීමේ දී කළ යුතු වන්නේ,
   (1) අවධානය වෙනතකට යොමු කිරීම ය. (2) සුරතල් කර නළවා ගැනීම ය.
   (3) ගණන් නොගෙන සිටීම ය. (4) දඬුවම් කිරීම ය.

27. යොවුන්විය දරුවන් අතර දක්නට **නොලැබෙන** ලක්ෂණයකි.
   (1) ආත්මාර්ථකාමී බව. (2) වීරාභිවන්දනය.
   (3) අසහනය. (4) ස්වාධීනත්වය කරා යාම.

28. කෙඳි වර්ගීකරණයට අනුව රෙයෝන් කෙඳි අයත් වනුයේ,
   (1) කෘත්‍රිම කෙඳි කාණ්ඩයට ය. (2) ඛනිජ කෙඳි කාණ්ඩයට ය.
   (3) අර්ධ කෘත්‍රිම කෙඳි කාණ්ඩයට ය. (4) ශාකමය කෙඳි කාණ්ඩයට ය.

29. පිස්මේන්තු මැස්ම භාවිත කර මැසීම ආරම්භ කරනුයේ මින් කවර මැහුම් ක්‍රමයක දී ද?
   (1) වාටි මැස්ම යෙදීමේ දී (2) හීන් නූල් දුවවීමේ දී
   (3) නූල් ඇදීමේ දී (4) බ්ලැන්කට් මැස්මේ දී

30. මැස්මෙහි සමානතාවක් පෙන්නුම් කරන විසිතුරු මැස්ම දෙකක් වනුයේ,
   (1) දම්වැල් මැස්ම සහ ලේසිඩේසි මැස්ම ය. (2) නැටි මැස්ම සහ කතිර මැස්ම ය.
   (3) ලේසිඩේසි මැස්ම සහ නැටි මැස්ම ය. (4) කතිර මැස්ම සහ දම්වැල් මැස්ම ය.

31. කුෂන් කවරයක් අලංකාර කිරීම සඳහා වර්ණවත් රෙදි කැබලි, මෝස්තරයක ආකාරයට තබා මසා නිමකර තිබුණි. මෙම ක්‍රියාවලිය හඳුන්වනුයේ,
   (1) ක්විල්ට් කිරීම යනුවෙනි. (2) එම්බොස් කිරීම යනුවෙනි.
   (3) එම්බ්‍රොයිඩර් කිරීම යනුවෙනි. (4) ආරෝපණය කිරීම (ඇප්ලික්) යනුවෙනි.

32. මූට්ටු වර්ග මැසීම පිළිබඳ ව සිසු සටහනකින් උපුටාගත් වැකි කිහිපයක් පහත දැක්වේ.
   A – රෙදි කැබලි දෙකෙහි නොපිට මුහුණට මුහුණ ලා සිටිනසේ එක මත තබා මූට්ටු කිරීම
   B – රෙදි කැබලි දෙකෙහි හොඳ පිට මුහුණට මුහුණ ලා සිටිනසේ එක මත තබා මූට්ටු කිරීම
   C – මූට්ටුවෙහි එක් පොටකින් අඩක් කපා වාටිය මැසීම
   D – පළමු මූට්ටුව නොපෙනෙන සේ දෙපොට අනෙක් පස හරවා මැසීම
   මින් ප්‍රංශ මූට්ටුව මැසීම හා අදාළ වැකි වනුයේ,
   (1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

33. සිරස් බොත්තම් කාසය මසා නිම කිරීමේ දී,
   (1) බොත්තම් කාස මැස්ම පමණක් භාවිත වේ.
   (2) බ්ලැන්කට් මැස්ම පමණක් භාවිත වේ.
   (3) බොත්තම් කාස මැස්ම සහ පිස්මේන්තු මැස්ම භාවිත වේ.
   (4) බ්ලැන්කට් මැස්ම සහ බොත්තම් කාස මැස්ම භාවිත වේ.

[හතරවැනි පිටුව බලන්න.

EXAMMOOD EXAMMOOD

5176

**34.** ළදරු ඇඳුමක් (Baby Shirt) කපා මැසීම හා සම්බන්ධ පියවර කිහිපයක් පහත දැක්වේ. මේ අතුරෙන් **වැරදි** පියවරක් වනුයේ,
(1) පෙර හැකිළවීම සඳහා රෙද්ද සේදීම ය.
(2) පතරොම රෙද්දෙහි බලවාටියට සමාන්තර ව ඇතිරීම ය.
(3) ඇඳුමත් පතරොමත් අතරින් කාබන් කඩදාසිය තබා දක්කු රේඛා සලකුණු කිරීම ය.
(4) උරහිස මසා විවරය, කර, අත්කට මැසීම ය.

**35.** උපාංග නිර්මාණයේ දී,
*A* – විවර පියවීම සඳහා දෙපෙති ජන්තු භාවිත කළ හැකි ය.
*B* – මැසීමේ ශිල්පීය ක්‍රම පමණක් යොදා ගනියි.
*C* – මතුපිට මෝස්තර ගැන්වීමේ ක්‍රම මගින් අලංකාරය වැඩි වේ.
*D* – හොඳපිට සහ නොපිට නිමාව පිළිබඳ ව සැලකිලිමත් විය යුතු ය.
මින් නිවැරදි ප්‍රකාශ වනුයේ,
(1) *A*, *C* හා *D* ය. (2) *A* හා *B* ය. (3) *B* හා *D* ය. (4) *C* හා *D* ය.

**36.** 'පවුල' පිළිබඳ ව ශිෂ්‍යාවක විසින් ලියන ලද සටහනකින් උපුටාගත් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
*A* – න්‍යෂ්ටික පවුලක මෙන් ම ආරම්භක අවධියෙහි පසු වන පවුලක මව, පියා සහ දරුවෝ සිටිති.
*B* – වර්ධක අවධියෙහි පසු වන පවුලක මව සහ පියාට අමතර ව ඥාතීහු ද සිටිති.
*C* – සංකෝචක අවධියෙහි පසු වන පවුලක මව සහ පියා සිටිති. සමහර විට ඒ අයගෙන් එක් අයෙක් පමණක් සිටියි.
*D* – විස්තෘත පවුලක මව, පියා සහ දරුවන් මෙන් ම ඥාතීන් ද සිටිති.
මින් නිවැරදි වැකි වනුයේ,
(1) *A*, *B* හා *C* ය. (2) *B*, *C* හා *D* ය. (3) *B* හා *C* ය. (4) *C* හා *D* ය.

**37.** නිවෙසක් සංවිධානය කිරීමේ දී කාමරවල පිහිටීම ඉතා වැදගත් ය. ඒ අනුව මින් **නොගැළපෙන** පිහිටීම කුමක් ද?
(1) කෑම කාමරය - විසිත්ත කාමරය
(2) විසිත්ත කාමරය - නිදන කාමරය
(3) නිදන කාමරය - නාන කාමරය හා වැසිකිළිය
(4) කෑම කාමරය - මුළුතැන්ගෙය

**38.** 'නම්‍යතාව' පිළිබිඹු වන්නේ මින් කුමන ගෘහභාණ්ඩය මගින් ද?
(1) කන්නාඩිය සහිත අල්මාරිය
(2) හකුළා තැබිය හැකි පුටුව
(3) දිග හැරිය හැකි ඇඳි සහිත සෝපාව
(4) යට ලාච්චු සහිත ඇඳ

**39.** කාමරයක දොර ජනේලවලට ඉහළින් වා කවුළු තැබීමේ අරමුණ වනුයේ,
(1) සිසිල් වාතය ඇතුළුවීමට ය.
(2) උණුසුම් වාතය පිටවීමට ය.
(3) සිසිල් වාතය පිටවීමට ය.
(4) හරස් සංවාතනය සිදුවීමට ය.

**40.** මුදල්, දේපළ සහ කාලය යන සම්පත් අයත් වන්නේ මින් කුමන කාණ්ඩයට ද?
(1) භෞතික සම්පත් හා භෞතික නො වන සම්පත්
(2) මානව සම්පත් හා භෞතික සම්පත්
(3) භෞතික සම්පත්
(4) මානව සම්පත් හා භෞතික නො වන සම්පත්

* *

EXAMMOOD

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

85 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

ගෘහ ආර්ථික විද්‍යාව I, II
மனைப் பொருளியல் I, II
Home Economics I, II

## ගෘහ ආර්ථික විද්‍යාව II

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ආහාර සුරක්ෂිතතාව, ආහාර පරිභෝජන රටාව, නිවාස ප්‍රශ්නය, දරුවන්ගේ රැකවරණය සහ ඇඳුම් විලාසිතා වර්තමානයේ දී සමාජය තුළ විශේෂ අවධානයට බඳුන් වී ඇති කරුණු කිහිපයකි. මෙම කරුණු ගෘහ ආර්ථික විද්‍යාව විෂයයට ඇතුළත් විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධ ය. සිසුහු කණ්ඩායම් වශයෙන් ඉහත සඳහන් කරුණු පිළිබඳ ව ව්‍යාපෘති මගින් අධ්‍යයනය කරති. එමගින් ඔවුහු මෙම කරුණු හා සම්බන්ධ ව යහපත් තීරණ ගැනීමට අවශ්‍ය නිපුණතා ලබා ගනිති.

(i) ගබඩා කිරීමේ දී ආහාරවල ගුණාත්මක ලක්ෂණ පවත්වා ගැනීමට බාධා ඇති කරන සාධක **දෙකක්** ලියන්න.

(ii) මනාව ඇසුරුම් කිරීමෙන් ආහාරවල සුරක්ෂිතතාව රැකගත හැකි වේ. ඇසුරුම් සඳහා භාවිත කරන ද්‍රව්‍ය **හතරක්** සඳහන් කරන්න.

(iii) ක්ෂණික ආහාර පරිභෝජනය **නුසුදුසු** වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.

(iv) උදේ ආහාරය නොගැනීම නිසා පාසල් දරුවන්හට ඇති වන **අහිතකර** ප්‍රතිඵල **දෙකක්** ලියන්න.

(v) ඇඳුම් සඳහා මෝස්තර නිර්මාණයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු **දෙකක්** ලියන්න.

(vi) ඇඳුමක මනා නිමාව කෙරෙහි බලපාන කරුණු **හතරක්** සඳහන් කරන්න.

(vii) දරුවන් අනතුරුවලින් වළක්වා ගැනීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් සංවිධානය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** ලියන්න.

(viii) මුල් ළමාවිය දරුවන් තුළ යහපත් පුරුදු ඇති කරවීමෙහි ලා දෙමව්පියන් විසින් ගත යුතු පියවර **දෙකක්** ලියන්න.

(ix) නිවසක් සැලසුම් කිරීම සඳහා භූමිය තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(x) නගරාශ්‍රිතව නිවාස ප්‍රශ්නය උග්‍ර වී ඇත. මෙය අවම කර ගැනීම සඳහා ජාතික මට්ටමින් ගෙන ඇති පියවර **දෙකක්** ලියන්න.

**2.** (i) (a) ළදරු ඇඳුමක් (Baby Shirt) නිර්මාණය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **තුනක්** ලියන්න.

(b) ළදරු ඇඳුම් පන්නයක් සඳහා සුදුසු පතරොමක් අඳින්න.

(ii) බිත්ති සැරසිල්ලක අද්දර අලංකාර ලෙස නිම කිරීම සඳහා යොදා ගන්නා ක්‍රම **දෙකක්** නම් කරන්න. ඉන් **එක්** ක්‍රමයක් පැහැදිලි කරන්න.

**3.** (i) තෙත් තාපය මගින් පිසීමේ ක්‍රම **තුනක්** නම් කරන්න. ඉන් **එක්** ක්‍රමයක් උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ii) පහත දැක්වෙන දෑ හඳුන්වන්න.

ආහාර පිළියෙල කිරීමේ දී,

(a) පදම් කිරීම (marinating)

(b) පැසීම (fermentation)

(iii) ආහාර පිරමිඩය, නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහන සහ පෝෂණ වගුව ආහාර වේල් සැලසුම් කිරීමේ දී උපයෝගී කර ගන්නා මූලාශ්‍ර වේ. ආහාර වේල් සැලසුම් කිරීමේ දී මින් **දෙකක්** වැදගත් වන අයුරු පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

EXAMMOOD

4. (i) පොලිසැකරයිඩ **තුනක්** නම් කර, ඒ එකිනෙක අඩංගු ආහාර ද්‍රව්‍යය බැගින් ලියන්න.
(ii) පරිභෝජනය සඳහා තිබූ කිරි සහ පාන්වල පහත දැක්වෙන වෙනස්වීම් සිදුව තිබුණි.
- කිරි ඇඹුල් රසවීම
- පාන් පෙතිමත කළු පැහැවීම

මේ එකිනෙකට හේතුව දක්වන්න.
(iii) ගර්භිණී මවකට උදේ ආහාර වේලක් සඳහා බොජුන් පතක් සැලසුම් කරන්න. මෙම ආහාර වේලෙහි එකිනෙක ආහාර ඇතුළත් කිරීමට හේතු දක්වන්න.

5. (i) නිවසේ දී ජලය අරපිරිමැස්ම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න.
(ii) පහත සඳහන් නිර්ණායක සැලකිල්ලට ගනිමින් නිදන කාමරයක් සඳහා පරිමාණයට අනුව බිම් සැලසුමක් අඳින්න.
- කාමරයේ ප්‍රමාණය - 12' × 10'
- අඩි 10 බිත්තියෙහි පියන් තුනක ජනේලයක් ඇත.
- අඩි 12 බිත්තියෙහි දොර පිහිටා ඇත.

(iii) නිවෙස් අලංකරණයේ දී ගෙවත්ත මනාව සංවිධානය කර ගත හැකි අයුරු සාකච්ඡා කරන්න.

6. (i) මාතෘ සායනයක දී ගර්භිණී මවක් රුධිර පරීක්ෂණයට භාජනය කරනු ලබයි. මෙම පරීක්ෂණයෙන් අනාවරණය කර ගනු ලබන කරුණු **තුනක්** සඳහන් කරන්න.
(ii) "නව යොවුන්විය තුළ ශීඝ්‍ර සමාජයීය වර්ධනයක් පෙන්නුම් කරයි." විමසන්න.
(iii) (a) මුල් ළමාවියෙහි දරුවන් පිළිබිඹු කරන චර්යාමය ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
(b) ඉන් **එකක්** ඇතිවීමට හේතු හා මඟහරවා ගැනීමට ගතයුතු පියවර සාකච්ඡා කරන්න.

7. (i) සටහන් ලියන්න.
පූර්ව ප්‍රසව සංවර්ධනය හා සම්බන්ධ,
(a) සංසේචනය
(b) අධිරෝපණය
(ii) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක, දරුවන්ගේ ගණිත සංකල්ප සාධනය සඳහා ක්‍රියාකාරකම් ගොඩනගා ඇත. **එක්** ගණිත සංකල්පයක් සාධනය සඳහා ඉවහල් කර ගන්නා ක්‍රියාකාරකමක් පැහැදිලි කරන්න.
(iii) නව යොවුන්වියෙහි ඇති වන ද්විතීයික ලිංගික ලක්ෂණ සාකච්ඡා කරන්න.

* * *

EXAMMOOD
EXAMMOOD